# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## පලමු වාර ඇගයීම - 2019

කාලය - පැය 3 යි

## නර්තනය ( දේශීය )    11 - ශ්‍රේණිය

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- ❖ අංක 1 සිට 40 දක්වා දී ඇති( 1 ), ( 2 ), ( 3 ), ( 4 ) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර සපයන්න

1. ජීවන වෘත්තීන් කරගත් නර්තන නිර්මාණ වන්නේ,
   1) ඔංචිලි වාරම් ප්‍රශස්ති මැටි
   2) යීවර මැටි චාමර
   3) කෘෂි මැටි පතල්
   4) යීවර මැටි කවන්නම්

2. "තානායම්පල" යනුවෙන් හැඳින්වෙන්නේ............... රගමඩලය
   1) සොකරි
   2) යක්තොවිල්
   3) කංකාරි
   4) කෝලම්

3. ශාන්ත නැමති ස්ථායිභාවයෙන් උපදින රසය වන්නේ,
   1) විශ්මය
   2) භක්ති
   3) උත්සාහ
   4) හාස්‍ය

4. උඩරට වන්නම් සහ පහත රට සිංදු වන්නම් රචනා වුයේ............. යුග වලදීය
   1) මහනුවර සහ මාතර
   2) මහනුවර සහ කෝට්ටේ
   3) මහනුවර සහ දඹදෙණිය
   4) ගම්පොළ සහ දඹදෙනිය

5. නවග්‍රහ දෝෂ දුරු කිරීම සඳහා කරනු ලබන ගායනයයි
   1) ටීකා සිවුපද
   2) ප්‍රශස්ති
   3) ග්‍රහපන්ති
   4) නෙතඟු

6. සතර අභිනයන් අතුරින් රංග වස්ත්‍රාභරණ.................... අභිනයට අයත් වේ.
   1) ආංගික
   2) සාත්වික
   3) ආහාර්යය
   4) වාචික

7. එක් මුහුණක් සහිත ආතත භාණ්ඩයක් ලෙස................. නම් කළ හැකිය.
   1) දවුල
   2) ගැටබෙරය
   3) රබාන
   4) යක්බෙරය

8. ගායනය රහිත සම්ප්‍රදායන් තුනට ම පොදු වු නර්තන අංගයක්................ ලෙස නම් කළ හැකිය.
   1) වන්නම්
   2) තාලම්
   3) සවුදම්
   4) වට්ටම්

9. "ත්‍රිවිධ ඥාණ වීදුරු පඩි අපෙ මහ" මෙම ගායනය................ නව්වලට අයත් වේ.

1) රබන්
2) පතුරු
3) සවරම්
4) චාමර

10. "ගුරු හාමි" සහ "වෙදරාළ" යන චරිත නිරූපනය වන ගැමි නාටකය වන්නේ ..................

1) මුදලි
2) කෝලම්
3) සොකරි
4) සඳ කිඳුරි

11. "කරදිය" මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරු වුයේ,

1) පණිභාරත මහතා
2) චිත්‍රසේන මහතා
3) සරත්චන්ද්‍ර මහතා
4) සිරිබෝහාමි මහතා

12. බන්දුල විජයවර්ධන ශුරීන් නිර්මානය කළ" හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්......"මෙම ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ,

1) වීදුර
2) බෙරහඬ
3) නරිබෑණා
4) මනමේ

13. මෙම රූපයෙන් දැක්වෙන ප්‍රවීන ශිල්පිනිය වන්නේ,



1) මිරන්ඩා හේමලතා මහත්මිය
2) වජිරා චිත්‍රසේන මහත්මිය
3) සෝමලතා සුභසිංහ මහත්මිය
4) ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය

14. ප්‍රස්තාරකරණයේදී ඇදෙන මාත්‍රා හඳුන්වනු ලබන්නේ,`

1) ලඝු නමිනි
2) ප්ලුත නමිනි
3) ගුරු නමිනි
4) ප්ලු නමිනි

15. කවිකාර මඩුවෙහි රජුගේ නෘත්‍ය මණ්ඩලයට වන්නම් රචනා කළ බව කියවෙන්නේ,

1) රම්මොළවක අධිකාරම්
2) ඇහැලේපොළ අධිකාරම්
3) කාල්ලිගොඩ අධිකාරම්
4) එක්නැලිගොඩ අධිකාරම්

16. මෙම රූපයෙන් පිළිඹිබු වන්නේ ,



1) ශෘංගාර රසයයි
2) රෞද්‍ර රසයයි
3) වීර රසයයි
4) ශාන්ති රසයයි

17. දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් පන්සියයක් නර්තනයේ යෙදෙන ආකාරය................. වාර්තාවෙන් සඳහන් වේ.

1) ස්පිල් බර්ජන්
2) රොබට් නොක්ස්
3) ඉබන් බතූතා
4) පාහියන් භික්ෂුව

ප්‍රශ්න අංක 18 – 22 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වගුව ඇසුරින් සපයන්න

| පේළිය | A තීරුව | Bතීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | කොහොඹකාරිය | දේවකෝල්පාඩුව | සන්නියකුම | උඩැක්කි වාදනය |
| 2 | අත්‍යා බෙර | දෙවොල් මඩුව | අස්නය | තෙල්මේ |
| 3 | පහන් මඩුව | මගුල්බෙර වාදනය | රබන් වාදනය | යක් ඇනුම |

18. පහත රට නර්තන සම්ප්‍රදායන්හි දෙවියන් වෙනුවෙන් කරන ලද ශාන්ති කර්මය සඳහන් වන්නේ,

1) 1 පේළියේ A තීරුවේය
2) 2 පේළියේ B තීරුවේය
3) 1 පේළියේ C තීරුවේය
4) 3 පේළියේ A තීරුවේය

19. ශාන්ති කර්මයන්හි දැකිය හැකි පොදු වාදන අංගයන් ඇතුළත් වන්නේ,

1) 3 පේළියේ B තීරුවේය
2) 2 පේළියේ B තීරුවේය
3) 3 පේළියේ C තීරුවේය
4) 1 පේළියේ D තීරුවේය

20. සබරගමු සම්ප්‍රදායට අයත් නර්තන අංගයක් සඳහන් වන්නේ,

1) 2 පේළියේ D තීරුවේය
2) 2 පේළියේ C තීරුවේය
3) 1 පේළියේ B තීරුවේය
4) 3 පේළියේ D තීරුවේය

21. කොහොඹ කංකාරි ශාන්ති කර්මයේ ගායනා රහිත නර්තන අංගයක් ඇතුළත් වන්නේ,

1) 1 පේළියේ B තීරුවේය
2) 2 පේළියේ C තීරුවේය
3) 2 පේළියේ D තීරුවේය
4) 3 පේළියේ D තීරුවේය

22. පහත රට නර්තන සම්ප්‍රදායෙහි සමූහ නර්තන අංගයක් ඇතුළත් වන්නේ,

1) 1 පේළියේ B තීරුවේය
2) 2 පේළියේ C තීරුවේය
3) 2 පේළියේ D තීරුවේය
4) 3 පේළියේ D තීරුවේය

**අංක 23 – 25 ප්‍රශ්න වලට පිළිතුරු රූප සටහන් මගින් සපයන්න**



1



2



3

23. මෙහි දැක්වෙන අනුපිළිවෙළිවෙලට 1 2 3 අංක පිළිවෙළින් දැක්වෙන්නේ,

1) උඩරට, සබරගමු ,පහතරට රංග වස්ත්‍ර කට්ටල වේ
2) උඩරට ,පහතරට ,සබරගමු රංග වස්ත්‍ර කට්ටල වේ
3) පහතරට, සබරගමු, උඩරට රංග වස්ත්‍ර කට්ටල වේ
4) සබරගමු ,පහතරට, උඩරට රංග වස්ත්‍ර කට්ටල වේ

24. මෙම රූප තුනට අනුව සම්ප්‍රදායන් තුනෙහිම පළඳිනු ලබන එකම ආභරණ වන්නේ ,

1) ලෝහයෙන් තනන ලද බන්ටි වළලු
2) රිදියේ තනන ගෙජ්ජි
3) පබළු වලින් තනන කරපටි
4) ලෝහයෙන් තනන සිලම්බු

25. අවුල් හැරය හා නළල් පටිය අයත් වන්නේ කුමන අංක වලින් දැක්වෙන රංග වස්ත්‍රාභරණ වලින්ද ,

1) අංක 1 සහ 2
2) අංක 1 සහ 3
3) අංක 2 සහ 3
4) අංක 3 සහ 2

26. කථකලී නර්තනය ප්‍රචලිත කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයක් වන්නේ ,

1) කේරල කලා මණ්ඩලය
2) කලා ක්ෂේත්‍රය
3) ශාන්ති නිකේලනය
4) භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලය

27. කථකලී නර්තන සම්ප්‍රදාය නිර්මාණය කිරීමේ ගෞරවයට හිමිවන්නේ ,

1) රවීන්ද්‍රනාත් තාගෝර් මහතාටය
2) චක්කියර් වරුන්ටය
3) වල්ලතෝල් නාරායනතුමන්ටය
4) තාන්ජාවූර් සහෝදරයින්ටය

28. සත්පත්තිනි ග්‍රහ අපලය දිව්‍යමංගලිකා යන මුද්‍රා නාට්‍යයන් නිර්මානය කරන ලද්දේ ,

1) නිමල් වෙල්ගම මහතා
2) එස් පණිභාරත මහතා
3) ඉඹුල්ගොඩ මහතා
4) ප්‍රේම කුමාර මහතා

29. තාලය තැබීමට යොදා ගන්නා ඝන වාද්‍ය භාණ්ඩයකි.

1) තාලම්පට
2) උඩැක්කිය
3) රබාන
4) හක්ගෙඩිය

30. අතීතයේදි සන්නිවේදන කටයුතු සඳහා වැඩි වශයෙන් භාවිතා කර ඇත්තේ,

1) දවුල හා ගැටබෙරය
2) ගැටබෙරය හා යක්බෙරය
3) තම්මැට්ටම හා දවුල
4) තම්මැට්ටම හා යක්බෙරය

31. 11 වන ගොඩ සරඹයේ නාමය වන්නේ,

1) බඹර සරඹයයි
2) පැනීමේ සරඹයයි
3) චන්ද්‍රිකා සරඹයයි
4) අංගහාර සරඹයයි

32. තාල රූප දෙකක් ඇති වන්නමකි .

1) තුරඟා
2) මුසලඩි
3) නෛයඩි
4) සැවුලා

33. කොහොඹ කංකාරිය පුරා වෘත්තයේ චරිත දෙකකි.

1) මලය හා කුවේණී
2) සේරමාන් රජු හා මලය
3) මහා සම්මත රජු හා කුවේණී
4) මැණික්පාල බිසව හා මලය

34. දොං ජිංත ගත දොංත වට්ටමට අයත් තාලරූපය.

1) මාත්‍රා 2 +3 දෙතිත
2) මාත්‍රා 2+4 දෙතිත
3) මාත්‍රා 2+4 දෙතිත
4) මාත්‍රා 3+3 දෙතිත

35. සිංහරාජ වන්නමට අයත් බෙර පසය වන්නේ,

1) දොං ජිංත ගත දොංත
2) දොදොංත තකු දොං
3) දෝං ජිං ජිං තකට දොං තක
4) දොං දොං ජිං ජිං ගජිගත

36. බර අත්ගෙන කගින්............... මෙම කවි පදයේ ඉතිරි කවි පදය වන්නේ ,

1) විය ගෙන කඳ කුමරුන්
2) ඇන කොන්තවි වලින්
3) දෙපලුව අසුරසෙන්
4) පලුදෙක ගෙන සැනින්

37. ගැටබෙරයෙන් නිකුත්වන මූලික අක්ෂර වන්නේ,

1) තක් ජිත් තොං නං
2) තක් දිත් තොං නං
3) තක් කිට තොං නං
4) තක් දිං තොං නං

38. මාත්‍රා 2+ 4 දෙතිතට අයත් වන්නමකි,

1) තුරගා
2) සැවුලා
3) නෛයඩි
4) මුසලඩි

39. දේශිය රංග වස්ත්‍රාභරණ සකස් කිරීමේදී බහුලව යොදා ගන්නා වර්ණ දෙකකි.

1) සුදු - කහ
2) සුදු - රතු
3) නිල් - කලු
4) කහ - රතු

40. ගැටබෙරයේ සම්මත දිග වනුයේ ,

1) එක් වියත් තුනගුලකි
2) තුන් වියත් දැගුලකි
3) තුන්වියත් සතරගුලකි
4) තුන්වියත් තුනගුලකි

# නැටුම් (දේශීය )

## 11 කොටස

- ❖ **පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ**
- ❖ **පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුලුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න**

1.

I. ගීතයක් අනුව නර්තන නිර්මාණය කිරීමේදී යොදා ගන්නා චලන වර්ග.......................... කි.

II. "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්" යනුවෙන් සඳහන් කරන්නේ....................... නම් දේශාටන කරුවාය.

III. ශාන්ත නැමති ස්ථායි භාවයෙන්................................ නැමති රසය උපදී

IV. කිසියම් රාජ ආඥාවක්පැනවීමේදී.............................................වාදනය කරනු ලබයි.

V. උඩරට වන්නමක පද නැටීමෙන් පසු..............................................නටනු ලබයි.

VI. තක් තකට තක රොං................................යන අඩව්ව මාත්‍රා............................දෙතිතට නටනු ලැබේ.

VII. කතකලී නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා............................නමින් හඳුන්වනු ලැබේ.

VIII. වෙස් නර්තන ශිල්පියා පපුවට පළඳින ආභරණය................... ..........නමින් හඳුන්වයි.

IX. හේවිසි වාදනයේදී යොදා ගනු ලබන අවනද්ධ භාණ්ඩ දෙක වන්නේ.....................හා............... වේ.

X. අනුරාධපුර යුගයේ නැටුම් පරම්පරාවක් ගැන සඳහන් සෙල්ලිපි දෙක.............හා...............වේ.

2.

I. ඔබ උගත් සම්ප්‍රදායට අනුව මාත්‍රා 3 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.(ලකුණු 3)

II. මාත්‍රා 2+4 දෙතිතට අයත් වන්නමක කවි පදයක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4)

III. පාත්‍රා 4 තාලයට අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 5)

3.

I. ශාන්ති කර්ම පැවත්වීමේ අරමුණු 2 ක් ලියන්න. (ලකුණු 2)

II. කොහොඹකංකාරිය හා දෙවොල්මඩුව යන ශාන්ති කර්ම දෙකට අයත් නර්තන අංග 2 බැගින් ලියා ඉන් ඔබ කැමති නර්තන අංග 2ක් පිළිබඳ කෙටි විචාරයක් කරන්න. (ලකුණු 4)

III. ඔබ කැමති ශාන්ති කර්මයක චාරිත්‍ර විධි 2ක් හඳුන්වන්න. (ලකුණු 2)

IV. ශාන්තිකර්මයක උපන් කථාවක් තුලින් සමාජයට ලබාගත හැකි ආදර්ශ හඳුන්වන්න. .(ලකුණු 4)

4.

I. සොකරි ගැමි නාටකය තුලින් ප්‍රචලිත ප්‍රදේශ 2ක් නම් කරන්න. (ලකුණු 2)

II. ප්‍රධාන චරිත දෙකක් නම්කර හඳුන්වන්න. .(ලකුණු 4)

III. රගමඬල කෙටියෙන් විස්තර කරන්න. .(ලකුණු 4)

IV. උඩරට වන්නි ප්‍රදේශයේ සහ ඌව බදුලු ප්‍රදේහයේ සොකරි නාටකය සදහා වාදනය කරන වාද්‍යා භාණ්ඩ දෙක නම් කරන්න. .(ලකුණු 2)

5.

I. කතකලී නර්තන සම්ප්‍රදායට අයත් සංගීත සම්ප්‍රදාය නම් කරන්න.(ලකුණු 2)

II. එම සම්ප්‍රදායට අයත් වේශ නිරූපන ක්‍රම 2ක් කෙටියෙන් විස්තර කරන්න.(ලකුණු 4)

III. රංග වස්ත්‍රාභරණ කොටස් 4ක් හදුන්වන්න.(ලකුණු 4)

IV. කතකලී නර්තන විධිමත් ලෙස ඉගැන්වීමට ආරම්භ කල ආයතනය නම් කරන්න.(ලකුණු 2)

6. පමත සදහන් මාතෘකා අතරින් 3ක් යටතේ විසතර කරන්න.

I. රබන් කවි

II. වන්නම්

III. ආහාර්ය අභිනය

IV. අවනද්ධ භාණ්ඩ

V. වජිරා චිත්‍රසේන මහත්මිය

7.

I. පන්ති කාමරයේ ගුරුවරයා හා සිසුන් අතර පවතින සාරධර්ම 4 ක් හදුන්වන්න.(ලකුණු 4)

II. ශාන්ති කර්මයක් පැවැත්වීමේදී අනුගමනය කෙරෙන සමාජ සාරධර්ම 4 ක් හදුන්වන්න.(ලකුණු 4)

III. නර්තන විෂය හැදෑරීමෙන් අප ලබන වටිනාකම් පිළිබද කරුණු 4 ක් යටතේ විස්තර කරන්න. (ලකුණු 3)